සංචාරක සංවර්ධන අරමුදල

1.1 මතය

මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණු වලින් මූල්‍ය ප්‍රකාශන වලට වන බලපෑම හැර 2011 දෙසැම්බර් 31 දිනට සංචාරක සංවර්ධන අරමුදලේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරිත්වය හා එහි මුදල් ප්‍රවාහ සත්‍ය හා සාධාරණ ලෙස දැක්වෙන අයුරින් ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර ඇති බව මා දරන්නා වූ මතය වේ.

1.2 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම්

1.2.1 ලැබිය යුතු හා ගෙවිය යුතු ගිණුම්

වටිනාකම රු. 143,504 ක් වූ අහරු වූ චෙක්පත් 07 ක් වර්ෂ 2 සිට 7 දක්වා කාලයක් මුළුල්ලේ පියවා නොතිබුණද, මුදල් රෙගුලාසි අංක 189 ප්‍රකාරව චෙක්පත් වල වටිනාකම අයකර ගැනීමට විධිමත් පියවර ගෙන නොතිබුණි.

1.2.2 නීති, රීති, රෙගුලාසි සහ කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම

පහත සඳහන් අනුකූල නොවූ අවස්ථා විගණනයේදී නිරීක්ෂණය විය.

(අ) 2005 අංක 38 දරන සංචාරක පනතේ 24 (2) වගන්තිය ප්‍රකාරව සහ 2003 අංක 25 දරන මුදල් පනතේ II කොටස ප්‍රකාරව සංචාරක බදු අයකර ගැනීම් වාර්තා සංචාරක සංවර්ධන බදු (සං.සං. බ.) අයකර දින 30 ක් ඇතුළත මහා භාණ්ඩාගාරයේ නියෝජ්‍ය ලේකම්වරයා වෙත ඉදිරිපත් කළයුතු වේ. එසේ වුවත් අරමුදල මෙම නියමයන්ට අනුකූල වී නොතිබුණි.

(ආ) 2005 අංක 38 දරන සංචාරක පනතේ 24 (4) වගන්තිය ප්‍රකාරව, සං.සං. බදු ගෙවීම් පිළිබඳ විස්තර දක්වා ලේඛනයක් පවත්වා නොතිබුණි.

2. මූල්‍ය හා මෙහෙයුම් සමාලෝචනය

2.1 මූල්‍ය ප්‍රතිඵල

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව, සමාලෝචිත වර්ෂය තුළ අරමුදලේ වැඩ කටයුතු වලින් ජනනය වූ ආදායම රු. මිලියන 1,695 ක් වූ අතර, ඊට අනුරූපව ඉකුත් වර්ෂයේ ආදායම රු. මිලියන 1,517 ක් වූයෙන් මූල්‍ය ප්‍රතිඵලයෙහි රු. මිලියන 178 ක වර්ධනයක් පෙන්නුම් කෙරුණි.

2.2 අරමුදල කළමනාකරණය

--------------------------

2005 අංක 38 දරන සංචාරක පනතේ විධි විධාන වලට අනුව අරමුදලේ කාර්යයන් සිදුකළ යුතුය. අරමුදල කළමනාකරණය කිරීම සම්බන්ධයෙන් පහත කරුණු නිරීක්ෂණය විය.

(අ) 2003 අංක 25 දරන මුදල් පනතේ 12 වගන්තිය ප්‍රකාරව සෑම බලපත්‍ර හිමි ආයතනයකින්ම එහි පිරිවැටුම මත සංචාරක බදු අයකළ යුතුය. එසේ වුවත් බලපත්‍ර හිමි ආයතන 2,372 ක් අතරින් ආයතන 1089 කින් බදු අයකර ගෙන නොතිබුණි.

(ආ) විගණනය කරන ලද ගිණුම් වාර්තා නොමැතිව රු. 492,490 ක් වූ සංචාරක සංවර්ධන බදු ගෙවූ තැනැත්තා වෙත නැවත ගෙවා තිබුණි.

(ඇ) අරමුදල මගින් පරිපාලන වියදම් ලෙස රු. 3,343,507 මුදලක් ශ්‍රී ලංකා සංචාරක සංවර්ධන අධිකාරිය වෙත ගෙවා තිබුණි. එසේ වුවත්, පරිපාලන වියදම් ගෙවීමට 2005 අංක 38 දරන සංචාරක පනතේ විධි විධාන සලසා නොතිබුණි. ශ්‍රී ලංකා සංචාරක සංවර්ධන අධිකාරියේ සභාපතිවරයා 2012 මැයි 02 දින පහත පරිදි මා වෙත වාර්තා කර තිබුණි.

"පනත අනුව සං.සං. බදු පරිපාලනය හා කළමනාකරණය ශ්‍රී ලංකා සංචාරක සංවර්ධන අධිකාරිය විසින් කළ යුතුය. මේ අරමුණ සඳහා ශ්‍රී ලංකා සංචාරක සංවර්ධන අධිකාරිය විසින් සේවක වැටුප්, දත්ත මෙහෙයුම් වත්කම්වල ක්ෂය, ලිපි ද්‍රව්‍ය යනාදි වියදම් දැරිය යුතු අතර අරමුදල දරන වියදම් වෙනුවෙන් වියදම් ප්‍රතිපූර්ණය කර ගැනීමට වෙනත් ආයතනයක් නොමැත. මෙම කරුණ සැලකිල්ලට ගෙන ශ්‍රී ලංකා සංචාරක සංවර්ධන අධිකාරිය පාලක මණ්ඩලය විසින් සාමාන්‍ය ගාස්තුවක් අරමුදලින් අයකර ගැනීමට තීරණය කළ අතර එය සමස්ථ ආයතන හතර මගින් බෙදා ගැනීමට නියමිතය. "

2.3 අභ්‍යන්තර විගණනය

----------------------

අරමුදලේ අභ්‍යන්තර විගණන කටයුතු ශ්‍රී ලංකා සංචාරක සංවර්ධන අධිකාරියේ අභ්‍යන්තර විගණන අංශය මගින් ආවරණය කළයුතුය. එසේ වුවත් සමාලෝචිත වර්ෂය තුළදී මෙකී විගණන අංශය මගින් කිසිදු විගණන කාර්යයක් අරමුදලේ කාර්යයන් සම්බන්ධයෙන් සිදු කර නොතිබුණි.

3. පද්ධති හා පාලන

------------------

විගණනයේදී නිරීක්ෂණය වූ පද්ධති හා පාලන අඩුපාඩු වරින්වර අධිකාරියේ සභාපතිවරයාගේ අවධානයට යොමු කරන ලදී. පහත සඳහන් පාලන ක්ෂේත්‍රයන් කෙරෙහි විශේෂ අවධානය යොමු විය යුතුය.

(අ) ගිණුම්කරණය

(ආ) අරමුදල් බෙදා හැරීම

(ඇ) සංචාරක සංවර්ධන බදු එකතු කිරීම

(ඈ) බලපත්‍ර නිකුත් කිරීම

(ඉ) බලපත්‍ර හිමි ආයතනවල මල්‍ය වාර්තා සමාලෝචනය